විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
**UNIVERSITY GRANTS COMMISSION**

මගේ අංකය / எனது இலக்கம் / My Number: UGC/HR/10/03
තැපැල් පෙට්ටිය / அஞ்சல் பெட்டி / Post Office Box: 1406

ඔබේ අංකය / உமது இலக்கம் / Your Number:
03.01.2024

20, වෝඩ් පෙදෙස, කොළඹ 07, ශ්‍රී ලංකාව.
20, வாட்டு இடம், கொழும்பு 7, இலங்கை.
20, Ward Place, Colombo 07, Sri Lanka.

Vice-Chancellors of Universities
Rectors of Campuses
Directors of Institutes

**<u>Filling of Vacancies in the Primary Grade (U-PL) posts in the University System through the Multi-Purpose Development Task Force Department</u>**

This is further reference to my letters of even number dated 26.10.2023, 08.11.2023, letter no. MPA/ADS/NL/MDTF/01/2023 of 29.11.2023 received from the Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government (**Annex I**) and letter no. HE/AD/05/විවිධ of 27.12.2023 received from the Ministry of Education **(Annex II)** regarding the filling of vacancies in the primary grade (U-PL) posts through the Multi-purpose Development Assistants.

However, since the Multi-purpose Development Assistants don't possess the required qualifications as per the relevant Schemes of Recruitment for primary grade posts, Universities and Higher Educational Institutions have sought clarifications and directives from the UGC and Ministry of Education on making appointments by deviating from relevant Schemes of Recruitment and other pertinent issues. As a result of discussions held with the Honorable Minister of Education in this regard, it has been advised to fill the vacancies in approved cadre in primary grade (U-PL) posts in the university system through the Multi-purpose Development Assistants in terms of the qualifications mentioned in relevant Schemes of Recruitment.

As such, you are hereby informed to make permanent appointments of Multi-purpose Development Assistants to the primary grade posts in your institution if qualifications are fulfilled according to the relevant Schemes of Recruitment and pay them as per the approved salary of primary grade (U-PL) posts.

Furthermore, you are hereby requested to immediately send the remaining names of the Multi-purpose Development Assistants to the Higher Education Division in order to forward them to the Ministry of Education at Isurupaya.

Your prompt attention to this matter is highly appreciated.

**Senior Prof. Sampath Amaratunge**
Chairman

Cc: Secretary/UGC

**Annex I**


රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு

**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ජාතික භාෂා අංශය  தேசிய மொழிகள் பிரிவு  National Languages Division

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.

Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MPA/ADS/NL/MDTF/01/2023 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 29 2023.11. |

අමාත්‍යාංශ ලේකම්වරු

පළාත් ප්‍රධාන ලේකම්වරු

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

ආයතන ප්‍රධානීන්

<u>**බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන් රාජ්‍ය ආයතනයන්හි ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා බඳවාගැනීමේ කටයුතු කඩිනම් කිරීම සහ බහුකාර්ය කාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ඇවර කිරීම**</u>

උක්ත කාරණය සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.11.23 දින පාර්ලිමේන්තු කාරක සභා කාමර අංක 03 හිදී පවත්වන ලද සාකච්ඡාව හා බැඳේ.

02. ඉහත සාකච්ඡාව මෙම අමාත්‍යාංශයේ ගරු රාජ්‍ය අමාත්‍යවරුන්, සහ අනෙකුත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකායේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන හා සෞඛ්‍ය යන අමාත්‍යාංශවල නිලධාරීන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරු කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද අතර සාකච්ඡාවේදී ගනු ලැබූ පහත සඳහන් තීරණ කෙරෙහි ඔබගේ කඩිනම් අවධානය යොමු කරවමි.

2.1 බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ කටයුතු දැනටමත් තීරණයකර ඇති පරිදි 2023.12.31 දිනට අවසන් කිරීම.

2.2 2023.10.15 දින දක්වා රජයේ ආයතනයන්හි ප්‍රාථමික මට්ටමේ තවදුරටත් ඇති පුරප්පාඩු හඳුනාගෙන එම පුරප්පාඩු එකී ආයතනයන්හි අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව අදාළ ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව වෙත සෘජුවම යොමු කිරීම. එසේ යොමුකරනු ලබන ඉල්ලීම් සඳහා දෙපාර්තමේන්තුව විසින් සුදුසු කාර්ය සහායකයින් නම් කලයුතු අතර ඔවුන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කොට 2023.12.31 දිනට ප්‍රථම ඔවුන් වෙත තාවකාලික පත්වීම් ලිපි නිකුත් කිරීම අවසන් කලයුතුය.

2.3 කිසියම් රජයේ ආයතනයක දැනටමත් ප්‍රාථමික මට්ටමේ තනතුරක පත්වීම් ලබා ශ්‍රේණි උසස්වීම් සඳහා සේවා කාලය සම්පූර්ණ කර ඇති අයවළුන්ට අදාළ උසස්වීම් ලබාදී එමගින් උද්ගතවන පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් ඉහත 2.2හි පරිදි බඳවාගැනීමට කටයුතු කිරීම, මෙම බඳවාගැනීමද 2023.12.31 දිනට ප්‍රථම අවසන් කලයුතුය.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 0112696211-13<br>011-2166000<br>011-3091295<br>011-2684223 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2683132 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | adsocnlg@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.pubad.gov.lk |

2.4 යම් සහයකයෙකුගේ වයස පුහුණුව සඳහා බඳවාගන්නා අවස්ථාව වනවිට අවුරුදු 45ට අඩුවෙනම් එවැන්නන් ස්ථිර කරනු ලබන අවස්ථාව වනවිට වයස අවුරුදු 45 ඉක්මවා තිබුනද ඔවුන් ස්ථිර සේවය සඳහා බඳවාගතයුතු අතර විශ්‍රාම වැටුප්/ අර්ථසාධක අරමුදල් හිමිකමද හිමිගැන්විය යුතුය. එසේම බඳවාගන්නා අවස්ථාව වන විටත් වයස අවුරුදු 45ට වැඩි අයවලුන් අර්ථසාධක අරමුදල් හිමිකම ලබාදිය හැකි රාජ්‍ය ආයතනය වෙත බඳවාගෙන ඔවුන්ට අර්ථසාධක අරමුදලේ හිමිකම හිමිගැන්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකගතාව ද ලැබී ඇත .

2.5 PL වැටුප් කාණ්ඩය හා සමාන්තරගත අනෙකුත් වැටුප් කාණ්ඩ සඳහාද (UL වැටුප් කාණ්ඩය වැනි) බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන් බඳවාගැනීම සිදු කිරිම හා එහිදී අදාල තනතුරට අයත් වැටුප්තලවල පිහිටුවීම කලයුතුය.

2.6 ඒ ඒ දිස්ත්‍රික්කයේ/පළාතේ රජයේ ආයතනවල ප්‍රාථමික මට්ටමට අදාලව ඇති පුරප්පාඩු සංඛ්‍යාව සීමාසහිත වන අවස්ථාවලදී, දැනටමත් එම දිස්ත්‍රික්කයේ/පළාතේ පුහුණුලාභී පත්වීමක් ලබාඇති පුහුණුලාභීන් අතුරින් ඉතා සාධුකම්පිත කාරණයක් හේතුකොට ගෙන එම දිස්ත්‍රික්කයේම හෝ පළාතේ රැකියාගත කිරීමට අවශ්‍ය පුහුණුලාභීන් හට දිස්ත්‍රික්කය/පළාත තුලම පත්වීම් ලබාදීමට කටයුතු කලයුතු අතර අනිකුත් කාර්ය සහායකයින් පුරප්පාඩු පවතින ආයතන වෙත යොමුකල යුතුවේ.

03. ඉහත සියළු තීරණ අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණසේවා දෙපාර්තමේන්තුව සහ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය සහිතව ඉහත සඳහන් පරිදි තීරණය කරන ලද මෙම තීරණ කඩිනමින් ක්‍රියාත්මක කලයුතු වේ (මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ අදාළ එකඟතාවය ඇතිව වේ) .

04. ඉහත කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනොත් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පාලන) දූ.ක- 071 866 5971 හෝ අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) දූ.ක- 077 233 6414 අමතන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.
(ඊ- මේල්- mdtfvacancies@gmail.com)

05. රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2023.12.31 දිනට ප්‍රථම බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ කටයුතු අවසන් කලයුතු අතර මෙතෙක් එම දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඔබ දැක්වූ සහයෝගයට ස්තූතිවන්ත වෙමි. නියමිත දිනට දෙපාර්තමේන්තුවේ කටයුතු ඇවර කිරීම සඳහා ඔබගේ කාරුණික සහයෝගය තවදුරටත් අපේක්ෂා කරමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්:

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | කරු.දැ.ගැ.ස |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - | කරු.දැ.ගැ.ස |
| 3. | අධ්‍යක්ෂ ජනරාල් - බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | | |
| 4. | අධ්‍යක්ෂ ජනරාල් - කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව | - | කරු.අ.ක.ස. |
| 5. | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් | | |
| 6. | ආයතන අධ්‍යක්ෂ ජනරාල් | | |

සැ.යු : රජයේ වියදම් කළමනාකරණ ක්‍රමවේදයට අනුකූලව මෙම ලිපිය විද්‍යුත් ක්‍රමවේදය මඟින් පමණක් ඔබ වෙත යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

**Annex II**


අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

+9411-2697721/+9411-2691378
+94112674768
info@mohe.gov.lk www.mohe.gov.lk

18, වෝඩ් පෙදෙස, කොළඹ 07.
18, வோட் பிளேஸ், கொழும்பு 07.
18, Ward Place, Colombo 07.


RECEIVED 29 DEC 2023 994

UNIVERSITY GRANTS COMMISSION 1030 29 DEC 2023 (26) CHAIRMAN

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. HE/AD/05/විවිධ | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023.12.27 |

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

<u>රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කර ඇති කමිටුව වෙත PL කාණ්ඩයේ අනුමත කාර්ය මණ්ඩලවල පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහයකයින් ලබාදීම සම්බන්ධවයි</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබටද පිටපත් සහිතව බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමුකරන ලද අංක. MDTF/PLN/DO1/05(Vol iii) දරන 2023.10.16 හා 2023.11.02 දිනැති ලිපි සමඟ බැඳේ.

02. එම ලිපි මගින් ඔබ ආයතනය යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි පවතින ප්‍රාථමික සේවා ගණයේ (UPL) පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහයකයින් බඳවා ගැනීම සම්බන්ධව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අදාල නාම ලේඛන යොමුකර ඇති නමුත් එම නාම ලේඛන අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා ඉදිරිපත් වන බහුකාර්ය පුහුණුලාභීන් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා අදාලවන බඳවාගැනීමේ පටිපාටීන්හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බවත්, ඒ අනුව අදාල ප්‍රාථමික සේවා තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකල නොහැකි බවත්, අදාල විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් මෙම අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

03. එබැවින්, විශ්වවිද්‍යාලයන්හි පවතින ගැටළු සම්බන්ධව ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී ලබාදුන් උපදෙස් පරිදි සහ ප්‍රාථමික සේවා ගණයේ තනතුරු පුරප්පාඩු පිරවීමට අදාලව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී පැවති සාකච්ඡාවේදී එකඟවූ පරිදි ඔබ ආයතනය යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වෙත ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා බඳවාගැනීම් සිදුකිරීමට අදාලව යොමුකරන ලද නාම ලේඛනයන්ට අනුව, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ තනතුරු (UPL) සඳහා වන බඳවාගැනීමේ පටිපාටීන්හි සඳහන් අදාල සුදුසුකම් සහිත බහුකාර්ය සංවර්ධන සහයකයින්ගේ බඳවාගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරන ලෙසත් ඉතිරි බහුකාර්ය පුහුණුලාභීන්ගේ නාම ලේඛන ඉසුරුපාය අධ්‍යාපන අංශය වෙත යොමු කිරීම සඳහා කඩිනමින් උසස් අධ්‍යාපන අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

දුරකථන අංකය - +94 011 267 1355
ෆැක්ස් අංකය - +94 011 267 4770
විද්‍යුත් ලිපිනය - <u>secretary@mohe.gov.lk</u>

පිටපත් : 1. අධ්‍යක්ෂ ජනරාල්, බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව - කරු. දැ. ගැ. ස
2. ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - කරු. දැ. ගැ. ස


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112685268
+94112682612
minister@mohe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112671355
+94112674770
secretary@mohe.gov.lk